

**කතා සාරාංශය**

අපි හැමෝම ගාඩියන් ඒන්ජල්ලා, නැත්නම් රැකවල් දූතයෝ ගැන අහලා තියනවා. සාමාන්‍යයෙන් අපි අහලා තියන කතන්දරවල තියෙන්නේ, එක්කෙනෙකුට ඉන්න පුළුවන් එක රැකවල් දූතයයි කියලනේ. එක්කෙනෙකුට වැරදීමකින් රැකවල් දූතයෝ දෙන්නෙක් හම්බුනොත් මොනවා වෙයිද? මේ කතාව අන්න ඒ ගැන. එකිනෙකට වෙනස්, එකිනෙකාගෙන් පරස්පර රැකවල් දූතයෝ දෙන්නෙක් ලැබිච්ච පුංචි කෙල්ලෙක් ගැන.

දෝණි ඉන්නේ ළමා නිවාසෙක. ළමා නිවාසේ ළමයින්ගේ වගේම පාලිකාවන්ගෙත්, සේවිකාවන්ගෙත්, ආදරය හොඳින්ම දිනාගත්ත කෙනා තමයි දෝණි. මේ ළමා නිවාසේ පටන්ගෙන තියෙන්නේ සීයා කෙනෙකුයි, ආච්චි කෙනෙකුයි. සීයා මැරිලා. අපේ කතාව පටන් ගනිද්දීම ආච්චිත් මැරෙනවා. ආච්චිගේ මරණය දෝණිට තදින් දැනෙනවා. මේ නිසාම දෝණි මුලින්ම සීයගෙන් ඉල්ලනවා එයාව බලාගන්න කෙනෙක් එවන්න කියලා. පස්සේ කවුරුවත්ම එන්නේ නැති තැන, ආච්චිගෙනුත් දෝණි මේ ඉල්ලීමම ඉල්ලනවා.

ඉල්ලීම් කරන අයට රැකවල් දූතයෝ දෙන්නේ 'රැකවල් දූත මධ්‍යස්ථානය' කියලා තැනකින්. මේකේ ලොක්කා ටිකක් ලංකාවේ සනත් ගුණතිලක වගේ කෙනෙක්. කොහොමින් හරි සිද්ධ වෙන වැරදීමකින් දෝනිට රැකවල් දූතයෝ දෙන්නෙක් ඇලොකේට් වෙනවා. එක්කෙනෙක් ලකා. හරිම වගකීම් සහගත, ආදරණීය චරිතයක්. අනිත් කෙනා සිකා, මිනිහ ඉතිං බූලම තමයි.

සඳගිරි ළමා නිවාසේ ආච්චී මියයාමේ සිද්ධිය තවත් කෙනෙකුට සුවිශේෂී සිදුවීමක් වෙනවා. ඒ තමයි ධනවත් ව්‍යාපාරිකයෙකු වෙන අකිල. ඒ ඇයි කියලා කතාවේ පස්සට යනකොට දැනගන්න හම්බෙයි.

දෝණිව හම්බෙන්න, සිකා එන්නේ බස් එකේ. ලකා එන්නේ තමන්ගේ බලය පාවිච්චි කරලා. කොහොමහරි මේ දෙන්නම දෝණිගේ කාමරේ ඉස්සරහාදී හම්බෙනවා. දෙන්න අතර වාදයක් යන්නේ කවුද 'ඇත්තම' රැකවල් දූතයා කියලා. සිකා කියන්නේ මුලින්ම යන්න කියලා කිව්වේ තමන්ට නිසා, තමන් තමයි නියම රැකවල් දූතයා කියලා. ලකා කියන්නේ මුලින්ම ආවේ තමන් නිසා තමන් තමයි රැකවල් දූතයා කියලා. කොහොමින් හරි දෙන්නගෙන් කවුරුවත් යන්න ලෑස්ති නෑ. ඒ නිසා දෙන්නම තීරණය කරනවා ඉන්න.

තමන්ට රැකවල් දූතයෝ දෙන්නෙක් ඇවිල්ලා කියලා දෝණි දැනගන්නවා. සතුට වැඩිකමටම දෝණි නිවාසේ නැටුම් ටීච වෙච්ච පාරමීට එයාලව පෙන්නන්න හැදුවත්, පාරමීට එයාලව පේන්නේ නෑ. ලකා සිකා කියන දෙන්නම පේන්නේ දෝණීට විතරයි. මේ අතර අර මුලින් කියපු අකිල, එයාගේ

සෙකට්‍රි රශ්මි එක්ක සඳගිරි ළමා නිවාසෙට එනවා. ඇවිල්ලා කියනවා එයාලා නොමිලේ පවත්වන සායනය ඊළඟ වතාවේ සඳගිරියේ පවත්වන්නම් කියලා. මේක පිටිපස්සේ තියෙන්නේ වෙන උවමනාවක්... ඒ මොකද්ද කියලා එතෙන්ට ආවම බලමු.

ලකා සිකා හා දෝණි අතර ක්‍රමයෙන් සුන්දර බැඳීමක් ඇතිවෙනවා. ලකා හා සිකා දෙන්නම තමන්ගේම විධිවලට දෝණිට ආදරේ කරන්න ගන්නවා. දෝණිත් පෙරළා මේ දෙන්නට ආදරේ කරනවා. මේ අතර අකිල අර කී සායනය නිවාසයේදී පවත්වන අතර, එහිදී ඔවුන් කරන්නේ යම් ආකාරයක දත්ත රැස්කිරීමක් බව අපිට පේනවා. පසුව අකිල, විදේශිකයෙකු හමුවී යම් ලිපි ගොණුවක් ඔහුට ලබා දෙන්නේ 'කෙල්ල හම්බුනා' ලෙස කියමින්. ඒ දෝණි පිළිබඳ ලිපි ගොණුවක්.

මේ අතර සිකාගේ මාර්ගයෙන් ලකා මත්පැන් හඳුනාගන්නවා. දෙදෙනා පදමට වෙරිවෙන අතර, මත්බවට ලොල් වෙනවා. මේ නිසා එක් වතාවක රැකවල් දූත මධ්‍යස්ථානයේ ලොක්කාගෙන් හදිසි කැඳවීමක් ලැබෙද්දී පවා ඔවුන් ලොක්කාට අරන් යන්නේ මත්පැන් බෝතලයක්. ලොක්කා එක් දරුවෙකු බලා ගැනීමට රැකවල් දූතයින් 'දෙදෙනෙකු සිටීම' ගැන ප්‍රශ්න කර අතර, දෙදෙනාටම දෝණි ලඟ සිටීමට අවශ්‍යය නිසා, මත්පැන් ලොක්කාට දී ඔවුන් වැඩේ ශේප් කරගන්නවා.

මේ අතර සිකා, නැටුම් ටීච පාරමීට ආදරය කරන්න ගන්නවා. නමුත් සිකාව පාරමීට පේන්නේ නැහැ. මේ නිසාම මේ ප්‍රේමය ඉතා සුන්දර ප්‍රේමයක් බවට පත් වෙනවා. කෙසේ වෙතත් සියල්ල කණපිට හැරෙන්නේ එක් දිනක දෝණි අතුරුදන් වී සිටීම නිසා. අවසානයේ ඔවුන් දැනගන්නේ දෝණිව 'හදාගැනීමට පවුලක් ලැබීම' හේතුවෙන් අකිල විසින් රැගෙන ගොස් ඇති බවට. මේ අතරම දෝණි යනු ආච්චීගේ දුවගේ දියණිය එනම් ආච්චිගේ සැබෑම මිණිබිරිය බවත් නිවාස පාලිකාව අප්සරා හෙළි කරනවා.

අකිල ළමා නිවාසයට පැමිණෙනවා. මේ මොහොතේ ප්‍රේක්ෂකයාට දැනගන්නට ලැබෙන්නේ අකිලට මේ රැකවල් දූතයන් දෙදෙනාව පෙනෙන බවයි. එය සිදුවන්නේ කෙලෙසද?

අකිල යනු සීයාගේ ගාඩියන් ඒන්ජල්. සීයා මේ නිවාසයේ ළමා ජාවාරමක් (ළමුන් විකිණීමේ ජාවාරමක්) සිදුකර තිබෙනවා. ඒ අවයව සඳහා. යම් කිසි ගාඩියන් ඒන්ජල් කෙනෙකුගේ හිමිකරුවෙක් 'නරක' වැඩක් කරනවානම්, ඔහුගෙන් ඉවත් වීමට ගාඩියන් ඒන්ජල් කෙනෙකුට වගකීමක් තියනවා. නමුත් අකිල සීයා මේ කරන දේට කැමති නිසා, රැකවල්දූතකම සදහටම අතහැර මනුෂ්‍යය වෙස් ගන්නවා. ව්‍යාපාරිකයෙකු ලෙස සීයා හමුවට එන අකිල, සීයාගේ ව්‍යාපාරයට උදව් කරමින් ධනවත් ව්‍යාපාරිකයෙකු බවට පත් වෙනවා.

මේ අතර සිකා හා ලකා ළමයා නැවත ගෙන එන්නට අකිලගේ ස්ථානයට යනවා. නමුත් අකිලට මේ දෙදෙනාව පේනවා. ඔවුන්ට ඇතුළු විය නොහැකි ලෙස ඔහු යම් උපක්‍රම යොදා තිබෙනවා. අකිල තමන් කවුද යන්න ලකා හා සිකාට කියනවා. අකිල අසලට පැමිණිය හැක්කේ රැකවල් දූත ස්වභාවය අතහැර (සදහටම) මනුෂ්‍යය වෙස් ගත්තොත් පමණයි. නමුත් දෝණි වෙනුවෙන් ලකා හා සිකා මේ සියල්ල කරන්න සූදානම් වෙනවා.

මේ අතර අවයව ගැලවීම සඳහා දෝණිව රහස් රෝහලකට රැගෙන යනවා. ලකා හා සිකා මේ ස්ථානය සොයාගෙන යනවා. නමුත් එතැනට යනවිට දෝණිගේ ශල්‍යකර්මය ආරම්භ කර අවසන්. ලකා හා

සිකා සටන් කර දෝණිව තමන් අතට ගන්නවා. නමුත් දෝණිව සනීප කරගැනීම සඳහා කෙටි කාලයක් තුල ඇව කොළඹ ගෙන යා යුතුයි. නමුත් ඒ වන විට රාත්‍රිය ලබන්නට සැරසුනා පමණයි. වාහන තදබදය හමුවේ ඒ කාලය තුල ඇයව කොළඹ රෝහලට ගෙන යාම කිසිසේත් කළ නොහැකියි.

මෙන්න මේ අවස්ථාවේදී තමයි සමාජ මාධ්‍යය සහ ශ්‍රී ලාංකීය මිනිසුන්ගේ අසම සම මනුෂ්‍යත්වය කළඑලි බහින්නේ. සමාජ මාධ්‍ය හමුවේ 'පාර ඉඩ දෙන' ලෙස විවිධ ප්‍රභලයන් විසින් කරන ඉල්ලීමට ශ්‍රී ලාංකීය මහජනයා ජාති බේධ, ආගම් බේධවලින් තොරව සම්භන්ධ වෙනවා. මිනිසුන් සියල්ලෝම ඉතා උනන්දුවෙන් දෝණිගේ ජීවිතය බේරා ගැනීම වෙනුවෙන් පෙළගැසෙනවා. වාහන ඉවත් කර පාර ඉඩ දෙනවා. අවසානයේ නියමිත වෙලාවට දෝණිව රැගෙන යන්නට ඔවුන් සමත්වෙනවා. ඒ නිසා දෝණිගේ ජීවිතය බේරෙනවා.

සිකාගේ හා පාරමීගේ ආදරය එල දරණවා. අළුතෙන් මනුෂ්‍යයන් වුන ලකා හා සිකා මනුෂ්‍යත්වයේ අසමසම රමණීයත්වය විඳින්නට පටන් ගන්නවා. මනුෂ්‍යත්වගේ ගුණයන් ගැන ඔවුන් පුදුම වෙනවා.

ෆැන්ටසි කතන්දරයක් තුල, සැබෑම මනුෂ්‍යත්වය ගැන මනා විවරණයක් ගෙන එන මෙම චිත්‍රපටය ප්‍රේක්ෂකයන්ගේ සිත්තුල වඩා සෞම්‍ය හා මෘදු හැඟීමක් ස්පර්ෂ කරනු ඇත.

| | චරිතයේ නම | විස්තරය | රංගන දායකත්වය |
|---|---|---|---|
| #1 | ලකා | පළමු රැකවලා | ලක්මාල් වීරසිරි |
| #2 | සිකා | දෙවන රැකවලා | ශාන් අරෝෂ |
| #3 | දෝණි | කුඩා දැරිය | නෙතිනි වීරසිරි |
| #4 | අප්සරා | පාලිකාව | ශාලිකා නදීෂානි |
| #5 | පාරමී | නැටුම් ගුරුවරිය | සුහන්දි චෝසදී |
| #6 | අකිල | ව්‍යාපාරිකයා | දර්ශන් තවරාජා |
| #7 | රශ්මි | අකිලගේ බිරිඳ | සුදීක්ෂා සමාධි |
| #8 | චීෆ් | රැකවලුන්ගේ ප්‍රධානියා | සනත් ගුණතිලක |
| #9 | ආච්චි | ළමා නිවාසයේ හිමිකාරිය | දිල්හානි අශෝකමාලා |
| #10 | සීයා | ළමා නිවාසයේ හිමිකරු | අජිත් වීරසිංහ |
| #11 | භාග්‍යා | ආච්චිගේ දුව | ගීත්මා බණ්ඩාර |
| #12 | මුරකරු | ළමා නිවාසයේ මුරකරු | වර්නි ප්‍රනාන්දු |

# තාක්ෂණික ශිල්පීන්

| | |
|---|---|
| අධ්‍යක්ෂණය | - ලක්මාල් වීරසිරි |
| නිෂ්පාදනය | - සුදේෂ් මුතුනවගොන්න |
| නිර්මාණ සැලසුම්කරණය | - සුනෙත් මාලිංග ලොකුහේවා |
| කැමරා අධ්‍යක්ෂණය | - මාධව කමලසිරි |
| තිර රචනය | - සුනෙත් මාලිංග ලොකුහේවා, ලක්මාල් වීරසිරි, ප්‍රියනාත් විදානපතිරණ |
| සංස්කරණය | - මාධව කමලසිරි, පැතුම් සඳරුවන් |
| පසුබිම් සංගීතය | - කසුන් කල්හාර |
| විශේෂ ප්‍රයෝග අධීක්ෂණය | - කසුන් චන්ද්‍රනාත් පතිරණ |
| නිෂ්පාදන කළමණාකරණය | - පාලිත තෙන්නකෝන් |
| සහය අධ්‍යක්ෂණය | - තරිඳු ආරච්චිගේ |
| වර්ණ සංයෝජනය සහ පසු නිෂ්පාදන සම්භන්ධීකරණය | - ශාන් අල්විස් |
| ගීත රූප රචනය | - චාරුක දූෂ්මන්ත |
| කලා අධ්‍යක්ෂණය | - අකුරම්බොඩ පියතිස්ස |
| ඇඳුම් නිර්මාණය | - පවිත්‍රා අබේසිංහ |
| අංග රචනය | - රංගන තිලකවර්ධන |
| කොණ්ඩා සැකසුම | - තිලිණි සමරසිරි, සුරාජ් රෂ් |
| ශබ්ද පරිපාලනය | - ශෂීන් ගිම්හාන |
| සටන් අධ්‍යක්ෂණය | - සඳුන් ප්‍රනාන්දු |
| නිශ්චල ඡායාරූප | - ඉන්දික මල්ලවාරච්චි |
| ආලෝකකරණ ශිල්පී | - ධනුෂ්ක රසදත් |